# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/3 - 2013 දෙසැම්බර් මස 23 වැනි සඳුදා - 2013.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනු ව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2013 නොවැම්බර් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

එම නිවේදනයෙහි නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය (අංක 69) ශීර්ෂයේ I වැනි II වැනි හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් ;

(70) විශේෂ ව්‍යාපෘති අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කඩිනම් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂ වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |

1A - PG 01885 — 625 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 2. අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | | |
| 3. අමාත්‍යාංශ විෂයපථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම | | |
| 4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | | |
| 5. කෘෂි ව්‍යවසාය සංවර්ධනය හා ව්‍යාප්ත කරලීම | | |
| 6. වකුගඩු රෝගීන් වැඩිවීමට බලපාන පාරිසරික සාධක හඳුනාගෙන එකී සාධක මගින් සිදුවන බලපෑම් අවම කිරීමට හෝ නැති කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 7. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් අමාත්‍යවරුන්ට සහායවීම | | |

01 - 262

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.